<u>කොළඹ දිසා අධිකරණයේදී ය.</u>

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ, අංක.167/4 දරණ ස්ථානයේ නිහාල් ශ්‍රී අමරසේකර.

<u>පැමිණිලිකරු.</u>

| | | |
|---|---|---|
| නඩු අංකය | : 3155/විශේෂ | එදිරිව |
| ස්වභාවය | : විශේෂ | |
| වටිනාකම | : රු.100,000/- | |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය | |

1. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, චියෝඩා-කු, ඕටමචි 1-චෝම් හි 2-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන සහ කොළඹ 02, චොක්ෂෝල් වීදියේ, අංක.315, දරණ ස්ථානයේ, ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන මිට්සුයි ඇන්ඩ් කම්පැනි ලිමිටඩ්.

2. ජපානයේ නීති යටතේ සංවිධානය වී තිබෙන හා පවත්නා සමාගමක් වන, ජපානයේ ටෝකියෝ නුවර, ෂින්ජුකු-කු, නිෂි-ෂින්ජුකු 1-චෝම් හි 25-1 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන හා මහරගම, හයිලෙවල් පාරේ, අංක.65 දරණ ස්ථානයේ ශ්‍රී ලංකාවේ සම්බන්ධිකරණ කාර්යාලයයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් තිබෙන තායිසෙ කෝපරේෂන්.

3. ජාපනයේ නීති යටතේ නිසි ලෙස සංවිධානය වී තිබෙන සංස්ථාවක් වන සහ ජපානයේ ටෝකියෝ නුවර, මිනාටෝ-කු, අටාගෝ 1-2-2, මොරි ගොඩනැගිල්ලේ අංක.9 දරණ ස්ථානයේ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය තිබෙන ගෘහ

නිර්මාණ ශිල්පීන් සහ සැලසුම්කරුවන් වන කන්තො කිකාකු සෙක්කිෂා යෝෂෝ ෂිබාටා ඇන්ඩ් ඇසෝෂියේට්ස්.

4. කලික් ලංකා ජැපෑන් හොටෙල්ස් ලිමිටඩ් වශයෙන් හැඳින් වූ සහ කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයේ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ්.

5. කොළඹ 03, ඇල්ප්‍රඩ් පෙදෙසේ, අංක.16 දරණ ස්ථානයෙහි හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ කෝර්නල් ලයනල් පෙරේරා.

6. කොළඹ 03, ධර්මපාල මාවතේ, අංක.51/3 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ ප්‍රෙඩ්රික් ජර්මේන් නොයෙල් මෙන්ඩිස්.

7. කොළඹ 07, ශ්‍රීමත් ආර්නස්ට් ද සිල්වා මාවතේ, අංක.23/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කයිර්ෂාස්ප් නරිමාන් චොක්සි.

8. කොළඹ 06, හැව්ලොක් පාරේ, අංක.696/2 දරණ ස්ථානයේ පදිංචි සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ දොන් පීටර් සෙවරිනස් පෙරේරා.

9. ජාපනයේ, කසගාව, චිගසාකි, ෆුජිමිචෝ, 6-38 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කසුටාකා කොබෝයි.

10. කොළඹ 06, රාමක්‍රිෂ්ණා මාවතේ, අංක.4 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කනපතිපිල්ලේ ශන්මුගලිංගම්.

11. දැනට කොළඹ 02, වොක්ෂෝල් වීදියේ, අංක.315 දරණ ස්ථානයේ සහ හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ අධ්‍යක්ෂ කොජි ඉතෝ.

<u>විත්තිකරුවෝ.</u>

(දිසා විනිසුරු, පී.විජයරත්න මැතිතුමා ඉදිරියේ දී, වාර්තා කළේ : ශ්‍රේණා ජයකොඩා විසිනි.)

<u>දිසා අධිකරණය, කොළඹ.</u>

<u>දිනය : 1991.09.09</u>

<u>නඩු අංකය : 3155/විශේෂ</u>

# නියෝගය.

මෙම නඩුවේ දී පැමිණිලිකරු 1 සිට 10 දක්වා නම් කළ විත්තිකරුවන්ට විරුද්ධව මෙම නඩුව පවරමින් සඳහන් කර සිටි කරුණු අතර, ප්‍රධාන වශයෙන් හෙළි කළේ පැමිණිලිකරු කොටස්කරුවෙකු වූ 4 වැනි විත්තිකාර සමාගම 1, 2, 3 විත්තිකරු වූ ජපන් ජාතික සමාගම් සමඟ ඇති කරගත් ගිවිසුම පරිදි ශ්‍රී ලංකාවේ හිල්ටන් හොටෙල් නැමැති හෝටලයේ ඉදි කිරීමේ කටයුතුවල දී එකී සමාගම් අතර ඇති කරගත් වංක සහයෝගයක් අනුව ක්‍රියා කරමින් කොන්ත්‍රාත් ගිවිසුම්වල අඩංගු කරන ලද පරිදි සහ සමාගම් විසින් හෙලි දැක්වුණු මෙම ව්‍යාපාර කටයුතු කිරීම ද විස්තරාත්මක වාර්තාවේ දැක්වූ පරිදිට වඩා වෙනස් වුණු ආකාරයෙන් මෙම හෝටලය සඳහා නියමිත ගොඩනැලිල්ල තනන ලද බවත්, ඒ අනුව මුදල් සැලසුම් හා අධීක්ෂණ වාර්තාව අනුව ගෙවිය යුතු වූ විශාල මුදලක් සම්බන්ධව මෙම

විත්තිකරුවන් විසින් වංක සහයෝගයෙන් ක්‍රියා කරමින් අඩු වැඩ කොටසක් කර, වැඩි මුදලක් ලැබීමක් තැත් කරන්නේ යයි කියා සිටියේ ය. මෙම කාර්ය සම්බන්ධයෙන් මුදල් ගෙවීමේ තත්ත්වය සම්බන්ධව ප්‍රශ්න මතු කරනු ලැබ, මෙම ගිවිසුම අනුව ක්‍රියාවන් කර ඇද්ද යන ප්‍රශ්නයම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ දී එහි නම් කළ අනිකුත් විත්තිකරුවන් එකී හෝටල් ව්‍යාපාරය සම්බන්ධව සම්බන්ධකම් දක්වන පුද්ගලයන් ලෙස ඒ සම්බන්ධයෙන් මැදිහත් වූ මෙම මුදල් ලබා ගැනිමට කටයුතු කරන්නේ යයි ද, මෙම ගෙවීම් සම්බන්ධව සහ ඉටුකළ වැඩ කොටස කොන්ත්‍රාත් ගිවිසුම් අනුව නොවිය යන පදනම මත වුණු කරුණු සම්බන්ධයෙන් නිවැරදි පරික්ෂණයක් කිරීමට ඔවුහු යුහුසුලු නොවන අතර, එය වලක්වා කෙසේ හෝ මුදල් ගෙවීම ඉෂ්ඨ කරදීමට ප්‍රයත්න කරන්නේ යයි යන පදනම මත මෙම පැමිණිල්ල ඉදිරිපත් කරමින් එහි සඳහන් කරුණු විනිශ්චයක් කරන තෙක් ඉදිකිරීම් ගිවිසුම, සැපයීම් ගිවිසුම, සැළසුම් ගිවිසුම සහ අධීක්ෂණ ගිවිසුම, ණය ගිවිසුම සහ ඇපකරය යටතේ කවරාකාර හෝ මුදලක් ඉල්ලා සිටිම, ලබා ගැනිම මැදිහත් වීම වළක්වන අතුරු තහනම් නියෝගයක් 1, 2, 3 විත්තිකාර සමාගම වෙත ද, 1, 2, 3 විත්තිකාර සමාගම්වල හෝ සේවක නියෝජිත ආදීන්ට එවැනි මුදල් ගෙවීමට 4 වැනි විත්තිකරුට තහනම් කරන නියෝගයක් ය.

අධිකරණය විසින් මෙම ඉල්ලීම සළකා එවැනි වූ වාරණ නියෝගයක් සහ අතුරු තහනම් නියෝග පිළිබඳ නිවේදන දී ඇත.

එයට විත්තිකරුවන් විසින් විරෝධතා ඉදිරිපත් කරනු ලැබ, ඒ සම්බන්ධයෙන් පාර්ශවකරුවන් වෙනුවෙන් උගත් නීතිඥ මහතුන් කරන ලද සැළකිරීම් ද මෙම විමසුමට විෂය විය. මෙම විරෝධතාවයන් සැළකිරීම් සහ නීතිමය තත්ත්වයන් සියල්ලම සලකා බැලීමේ  දී පැහැදිලි වන තත්ත්වය 1, 2, 3 විත්තිකරුවන්ට මෙම ගිවිසුම මත මුදල් ලබා ගැනිමට ඇති අයිතිය පිළිබඳව ගිවිසුමේ අනෙක් පාර්ශවකරු වූ ද මෙහි විත්තිකාර සමාගම තර්ක නොකරයි. එහෙත් සමාගමේ කොන්ත්‍රාත්කරුවන් වූ පැමිණිලිකරු දකින්නේ එය සමාගම ද, එකතු වී සමාගම සම්බන්ධව උනන්දුවක් දක්වන වෙනත් කොටස්කරුවන් ද පර්ශවකරුවන් ද ඔවුන් සමාජයේ ලැබූ බලය (influence) යොදා මෙම සමාගමේ ගිවිසුම සම්බන්ධව කටයුතු සහ ගිවිසුම් පත්‍රය ද ගෙවීම් සහ

ගිවිසුම හරිහැටි ක්‍රියාත්මක කළේ ද යන කරුණු සම්බන්ධව ප්‍රශ්නයක් නැගීම වළක්වන බවත්, ඒ අනුව ඔවුන්ගේ සහයෝගතාවය 4 වැනි විත්තිකාර සමාගමේ කොටස්කරුවන්ගේ අයිතීන්ට පටහැනි සහ අයිතීන් පරාජය කරන අන්දමේ දැක්වෙන සහයෝගයක් මගින් කරන බවත් මෙහි දී මූලික වශයෙන් තර්කයට විෂය වුනු තත්ත්වයයි.

මේ අනුව විත්තිකරුවන් විසින් දක්වන පරිදි ගිවිසුම මත තමාගේ කොටස් ඉටු කර ඇතැයි කියා සිටිම සමාගම එය පිළි ගැනිමට කැමැත්ත දැක්වීමක් ගෙවීමට පදනම ලෙස පිළිගැනිමට නොහැකි විම වර්තමාන තත්ත්වයයි.

ඒ අනුව ඇත්ත වශයෙන්ම සලකා බැලිය යුතු වන්නේ සමාගම විසින් මෙම කරුණු සම්බන්ධයෙන් එනම්, 1 සිට 3 දක්වා විත්තිකරුවන් සමඟ ඇතිවුණු ගිවිසුම් සම්බන්ධව දරණ තත්ත්වය සමාගමේ කොටස්හිමියන්ගේ අයිතිවාසිකම්වලට පටහැනි වන්නේ ද නැතහොත් සාධාරණ ලෙස ක්‍රියාවකින් ආරක්ෂා කිරිමට නොවන්නේ ද සහ සමාගම විසින් මෙසේ මුදල් ගෙවීම සත්‍ය වශයෙන් ම මෙම ගිවිසුම් මත 1, 2, 3 විත්තිකරුවන්ගේ ලැබිය යුතු මුදල් ගෙවීමක් ද නැතහොත් එමගින් මෙම පැමිණිලිකරු පවසන පරිදි විශාල පරිමාණයක් විදේශ විනිමය රටින් බැහැර කිරිමේ උපාය මාර්ගය වන්නේ ද යන කරුණු ය.

මෙම කරුණු ඇත්තවශයෙන්ම සලකා බැලිය හැක්කේ අදාළ කරුණු පිළිබඳව සාක්ෂි මත පැවැත්වෙන පූර්ණ විභාගයකදී ය. එතෙක් මෙම ගෙවීම් කළේ නම්, පැමිණිලිකරු විසින් සඳහන් කරන ලද පරිදි ඔහු විසින් වැළැක්වීමට උත්සාහ කරන සමාගමේ කොටස්කරුවකු සම්බන්ධයෙන් සමාගම විසින් සමාගමේ අයිතිවාසිකම් ආරක්ෂා නොකර වෙනත් සමාගම්වල අවශ්‍යතාවයන් පරිදි කටයුතු කිරිම අනුව ඔහුට සිදුවියහැකි පාඩුව අපරිමිත හා අසීමිත බවට පැහැදිලි වන්නේ ය. මෙහිදී දැක්වෙන විශේෂත්වය නම්, සාමාන්‍ය වශයෙන් මුදල් ගෙවීමට ඇති සමාගම මෙවැනි තත්ත්වයන්

පිළිබඳව ප්‍රශ්න කරමින් අත්තනෝමතික ලෙස කටයුතු කිරීමට අනිත් පාර්ශවයන්ට ඉඩ නොදිය යුතු බවයි. මෙහිදී පැමිණිලිකරු චෝදනා කරන්නේ සමාගමේ 1 සිට 3 දක්වා විත්තිකරුවන් සමඟ එක්වී මෙම මුදල් සමාගමෙන් සහ දිවයිනෙන් බැහැර කර සමාගමේ කොටස්කරුවන්ගේ අයිතිවාසිකම්වලට පටහැනි ක්‍රියා කිරීම වැළැක්වීමයි. මෙය ඇත්ත වශයෙන්ම පැහැදිලි කරන තත්ත්වය නිවැරදි නම් වංක සහයෝගයෙන් ක්‍රියා කරන අවස්ථාවකි. මෙවැනි අවස්ථාවකදී එය වැළැක්වීම සඳහා නීතිමය පියවර යුක්තිය අපේක්ෂා කරන පාර්ශවකරුවෙකු විසින් කිරීමට ඉඩදිය යුතුය. එබැවින් මෙම කරුණු සම්බන්ධයෙන් සමස්ථයක් වශයෙන් ගෙන බැලීමේ දී නිකුත් කළ වාරණ නියෝගය අවලංගු කිරීමට වඩා අතුරු තහනම් නියෝගය නිකුත් කිරීමේ අවශ්‍යතාවයක් ඇතැයි මගේ අදහසයි.

එවැනි අදහසක් පෙරදැරි කොටගෙන මෙය නිකුත් කිරීම නිසා පාර්ශවකරුවන්ට ඇතිවිය හැකි පාඩුව සහ අපහසුව සලකා බැලීමේ දී මෙම තහනම් නියෝගය නිකුත් නොකළේ නම්, මුදල් දිවයිනෙන් බැහැරවීම සහ සමාගම විසින් මුදල් ගෙවීමෙන් පසුව එය නැවත අයකර ගැනීමේ හෝ ඒවා පොදුවේ මෙම රටටත් මේ රටේ පිළිගත් ආයෝජකයෙකු වන පැමිණිලිකරුටත් සිදුවන පාඩුව විශාල වන අතර, එයට ප්‍රතිකර්ම යෙදීමේ ඇති අවස්ථාව විරල වනු ඇත.

මෙයට එරෙහිව තුලනය කිරීමට ඇති 1, 2, 3 විත්තිකරුවන් මුදල් ලබාගැනීමේ අයිතිය සම්බන්ධව සලකාබැලීමේ දී පැමිණිලිකරුගේ ඉල්ලීම පරිදි තහනම් නියෝගය නිකුත් කළත්, එම තහනම පරිදි ඔවුන්ට හිමි මුදලක් ඇත්නම් එය ලබා ගැනීම ප්‍රමාද වනවා හැරෙන්නට එම මුදල් ලැබීමට ඇති ඔවුන්ගේ අයිතියට එයින් බාධාවක් නොවනු ඇත. එවැනි ප්‍රමාදයක් ප්‍රමානාන්විත පොළී ගෙවීමක් මගින් ප්‍රතිකර්ම යෙදීමට හැකි වන්නේ ය.

මේ අනුව මෙම දෙපක්ෂයට මෙවැනි නියෝගයකින් ඇතිවිය හැකි අපහසුව සහ පාඩු සලකා බැලීමේ දී එහි වැඩි බර පැමිණිලිකරු ඉල්ලා ඇති පරිදි තහනම් නියෝග නිකුත් කිරීමට පක්ෂව වන

බවට මගේ අදහසය. එබැවින් දැක්වුනු විරෝධතා ප්‍රතික්ෂේප කරමින් ඉල්ලා ඇති පරිදි පැමිණිල්ලේ ආයාචනයේ 'උ' සහ 'ඌ' යටතේ අතුරු තහනම් නියෝග නිකුත් කරමි.

මෙම ගිවිසුම සම්බන්ධයෙන් තක්සේරු කරන ලද ගාස්තුව 1 සිට 4 දක්වා විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු ය.

අත්. කළේ/පී. විජයරත්න,
දිසා විනිසුරු, - කොළඹ - 1991.09.09.

---

මෙහි දැක්වෙනුයේ කොළඹ දිසා අධිකරණයේ 3155/විශේෂ නඩුවේ 1991.10.28 වෙනි දින නිකුත් කරන ලද නියෝගයේ සත්‍ය පිටපතක් බැව් මෙයින් සහතික කරමි.

රෙජිස්ට්‍රාර්,
අතිරේක රෙජිස්ට්‍රාර්
දිසා අධිකරණය, කොළඹ.
කොළඹ

පිටපත් කළේ:
සැසඳුවේ: V/18 724 204

ඉහත සඳහන් වනුයේ කොළඹ දිසා අධිකරණයේ 3155/විශේෂ නඩුවේ 1991.1[illegible] [illegible] දින නිකුත් කරන ලද නියෝගයේ යථාර්ථ සත්‍ය පිටපතක් බැව් සහතික කරමි.

පිටපත් කළේ: V/18 724 206
රෙජිස්ට්‍රාර්.